**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 28 දින ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 8,090,902 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.12,709,110 ක් විය.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**
-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.20,638,947 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**
----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රජාපාදක සංවිධානවලට ද්‍රව්‍යාධාර ලබාදීම සඳහා එක් අවස්ථාවකදී රු.12,500 ක මුදලක් වැයකර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය 180 රීතිය | ආදායම් රැස්කරන, මුදල් හෝ ගබඩා කටයුතු භාරව කටයුතු කරන නිලධාරීන් විසින් සේවක ඇප තබා නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 — තැන්පත් කර වසර 02 ක් තුල හිමිකම් නොපෑ රු.16,000 ක් වටිනා තැන්පතු නියාදනය කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2008 මාර්තු 13 දිනැති අංක පී.එෆ්/427(1) දරන චක්‍රලේඛය — සභාව සතු අංක UPRB - 9997 දරන ට්‍රැක්ටර් රථය සඳහා රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.218,966 ක් වූ අතර, ඊට අනුරූපීව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.687,861 ක් විය. ඒ අනුව රු.468,895 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 753,018 | 1,068,842 | (315,824) | |
| බදු කුලී | 1,780,358 | 1,461,050 | 319,308 | |
| බලපත්‍ර ගාස්තු | 320,299 | 346,606 | (26,307) | |
| සේවා සඳහා ගාස්තු | 758,687 | 839,223 | (80,536) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 637,904 | 366,886 | 271,018 | |
| වෙනත් ආදායම් | 295,025 | 300,160 | (5,135) | |
| ආදායම් ආධාර | 8,603,698 | 7,491,177 | 1,112,521 | |
| | | | ------------ | 1,275,045 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් හා දීමනා | 9,888,554 | 9,099,155 | (789,399) | |
| ගමන් වියදම් | 309,686 | 290,499 | (19,187) | |
| සැපයුම් හා උපකරණ | 317,658 | 433,432 | 115,774 | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,764,276 | 2,020,119 | 255,843 | |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 656,641 | 547,433 | (109,208) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 10,000 | - | (10,000) | |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 347,963 | 72,245 | (275,718) | |
| විශ්‍රාම වැටුප් විශ්‍රාම පාරිතෝෂික හා ප්‍රතිලාභ | 73,178 | 98,923 | 25,745 | |
| | | | ----------- | 806,150 |
| වාසිදායක විචලනය | | | 468,895 | |
| | | | ======= | |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

ජල ගාස්තු හා කඩ කුලී වලින් 2013 ජනවාරි 01 දිනට පැවැති හිඟයෙන් අයකිරීම්වල ප්‍රගතිය 74% කට වඩා අඩු අගයක් ගෙන තිබූ අතර, ජල ගාස්තු සඳහා වර්ෂයේ බිල්කල ආදායමින් අයකිරීමේ ප්‍රගතිය 68% ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

2.3.2 **බදු කුලී**

2006 වර්ෂයට අදාලව මීගහකිවුල නගරයේ සතිපොල බදු දීම වෙනුවෙන් රු.123,181 ක හිඟ බදු මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 383,373 |
| මුද්දර ගාස්තු | 1,151,471 |
| | 1,534,844 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **නිෂ්කාර්ය වත්කම්**

2002 වර්ෂයේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ රු.533,100 ක් වැයකර ඩොලමයිට් ව්‍යාපෘතියක් සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල එම ව්‍යාපෘතිය ආරම්භ නොකර අතහැර දැමීම නිසා 2003 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.

3.2 **කසල බැහැර කිරීම**

සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන අතර සභා බල ප්‍රදේශයේ රැස්කරනු ලබන කැලිකසල බදුල්ල පාර 13 සැතපුම් කණුව අසල ඉඩමකට අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුනි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිනුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කර නොතිබුණි.

4.2 **අයවැය පාලනය**

සභාවේ 2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම ප්‍රතිශතය | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 1,153,000 | 753,018 | 399,982 | 34.6 |
| බලපත්‍ර ගාස්තු | 200,500 | 320,299 | 119,799 | 59.7 |
| සේවා සඳහා ගාස්තු | 2,505,000 | 758,687 | 1,746,313 | 69.7 |
| වෙනත් ආදායම් | 374,000 | 295,025 | 78,975 | 21.1 |
| ආදායම් ආධාර | 7,518,294 | 8,603,698 | 1,085,404 | 14.4 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| ගමන් වියදම් | 360,000 | 309,686 | 50,314 | 13.9 |
| සැපයුම් හා උපකරණ | 437,000 | 317,658 | 119,342 | 27.3 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 2,050,000 | 1,764,276 | 285,724 | 13.9 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 815,000 | 656,641 | 158,359 | 19.4 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 272,500 | 347,963 | 75,463 | 27.6 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 142,304 | 73,178 | 69,126 | 48.5 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය